# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 10 ශ්‍රේණිය

The National e-learning Portal for The General Education
Start Your Learning Journey with e-thaksalawa

විෂයය - සිංහල සාහිත්‍යය

ශ්‍රේණිය - 10

වාරය - 01

ඒකකය - 02 ගුත්තිල වෙණ නද

ඉගෙනුම් පල -

- නිර්දිෂ්ට කෘති ලියැවුණු කාලය හා කතුවරයා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිර්දිෂ්ට සාහිත්‍ය නිර්මාණවල කතුවරුන්ගේ වෙනත් කෘති නම් කරයි.
- නිර්දිෂ්ට කෘතිවල කතුවරුන්ගෙන් සාහිත්‍යයට සිදු වූ සේවාව අගය කරයි.
- ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කෘති අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය ඉදිරිපත් කරයි.
- කවියා යොදාගත් කාව්‍යෝපක්‍රම අගය කරයි.
- නිර්දිෂ්ට පද්‍ය නිර්මාණය රස විඳිමින් අගය කරයි.

**ක්‍රියාකාරකම i**

කෙටි පිළිතුරු සපයන්න.

1. ජාතක කතා ඇසුරෙන් රචනා වූ ගී කාව්‍ය දෙකක් නම් කරන්න.

   i. -----------------------  ii. -----------------------------------

2.

   i. ජාතක කතාවක් ඇසුරෙන් ලියැවුණු සිවුපද මහා කාව්‍යයක් නම් කරන්න.
   ii. කුස ජාතකය මුල් කර ගෙන රචනා කොට ඇති සිවුපද කාව්‍යයේ රචකයා නම් කරන්න.

3.

   i. ගුත්තිල කාව්‍යය රචනා කළ යුගය නම් කරන්න.
   ii. එම කාව්‍යය රචනයට ආරාධනා කළ තැනැත්තාගේ නම ලියන්න.

4.

   i. වැත්තෑවේ හිමියන්ගේ ගුරු හිමියන්ගේ නම කුමක් ද?
   ii. උන්වහන්සේ කෙරෙහි තම නො මනාපය පළ කිරීමට ගුරු හිමියන් සිදු කළේ කුමක් ද?

5.

   i. ගුත්තිල කාව්‍යයේ පද්‍ය ගණන කොපමණ ද?
   ii. කාව්‍යය අරඹා ඇති ගණය කුමක් ද?



Copyright©www.e-thaksalawa.moe.gov.lk

6.

i. ගුත්තිල කාව්‍යය රචනා කිරීමට කවියා පෙළඹ වූ අරමුණ කුමක් ද?
ii. මෙම කාව්‍යය අයත් වන්නේ කවර කාව්‍ය ගණයකට ද?

7.

i. මූසිල විසූ නගරය කුමක් ද?
ii. ශක්‍ර දේවේන්ද්‍රයාගේ ආසනය හඳුන්වන්නේ කවර නමකින් ද?

8.

i. ගුත්තිල ජාතකය අන්තර්ගත කෘතිය රචනා වූයේ කවර යුගයක ද?
ii. මෙම ජාතකය එහි කී වෙනි කතා පුවත ද?

**ක්‍රියාකාරකම ii**

1. කැර මිණි බරණ රැස්
**රසින් සුර සැවු සුවහස්**
සුරන් සහ සහසැස්
නොකැර සිටියේ අහස් කුස් හිස්

i. අහස් කුස හිස් නො කර සිටියේ කවු ද?
ii. කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අර්ථය ලියන්න.

2. තත මතු ද සින්දේ
**පිළිමල් දප ද සින්දේ**
යස දිගත ඇන්දේ
විජය සිරිසඳ ගෙන වැලැන්දේ

i. සිඳලූයේ කුමන තත ද?
ii. කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

අන්තර්ගතය -එච්.එම්.ජේ.එස්.කුමාරසිංහ, ආනන්ද විද්‍යාලය, කොළඹ 10
සැකසුම -කේ.ජී.එම්.අයි.තුෂාර, බ/අලුයටවෙල මහ විද්‍යාලය, මහියංගණය
Copyright©www.e-thaksalawa.moe.gov.lk

3. **දිය දිය ගොස** පළ කරමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි
-----------------------------------------------------------------

i. මෙහි ඉතිරි කාව්‍ය පාදය ලියන්න.
ii. තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

4. බැඳි දන මන වැයුමෙහි ඇඳුරෝයා
**විඳි සත්සර වෙණ සර මදුරෝයා**
රැඳි සතොසින් සැනහුණු ඉඳුරෝයා
වැඳි දන සිරි ගත්තුය කිඳුරෝයා

i. තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අර්ථය ලියන්න.
ii. කින්නරුන් ගත්තේ කවුරුන්ගේ විලාසය ද?

5. රැති වනපෙතිනැවිදින් සුමුවෝ යා
නිති මියුරැති **වෙණ නද ළමුවෝ යා**
සිතිවිලි නැති රූ විලස මුවෝ යා
තැති නොගනිති මිනිසුන් සමුවෝ යා

i. මුවන් සිටියේ කුමන විලාසයෙන් ද?
ii. තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**ක්‍රියාකාරකම iii**

1. කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන්රසු දැල් කොලහල වන බියෙනේ
සන්සල නොව එහි පිළි රූ ලෙසිනේ
**නන් හය සෙන් සිටියෝ සිටි මතිනේ**

(අ) කළු අකුරෙන් මුද්‍රිත පද්‍ය පාදයේ අර්ථය ලියන්න.

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

අන්තර්ගතය -එච්.එම්.ජේ.එස්.කුමාරසිංහ, ආනන්ද විද්‍යාලය, කොළඹ 10
සැකසුම -කේ.ජී.එම්.අයි.තුෂාර, බ/අලුයටවෙල මහ විද්‍යාලය, මහියංගණය
Copyright©www.e-thaksalawa.moe.gov.lk

2. වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පියපත් විදමිනි
පුරඹර වසමින් සිටි රඟ කුම් වැනි
සුර සෙනඟට සුරසුන් පැන වූ වැනි

(අ) මෙහි ඇතුළත් උපමාව හා උපමේය ඔබේ වචනයෙන් ලියන්න.

(ආ) මෙයින් ප්‍රකාශ වන්නේ කවර අවස්ථාවක් ගැන ද?

3. සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින **පිල්බර ගණ** ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදයන්ගේ අර්ථය ලියන්න.

(ආ) මෙහි සඳහන් අය නො සතුටු වූයේ කුමකට ද?

4. යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කර එක සී
අහසින් බැස රඟ ගත් රඟ කෙලසී
දිසි මෙන් විය විදුලිය සිය දහසී

(අ) ජනයාගේ සිත් මත් කළේ කුමකින් ද?

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

5. පුන් මදාරා මල් දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා
මන් මදා කිතු ලිය ලෙසින් උර තුර සරා දිලි මුතු ලතා
**මන් නදා වන මිණි මෙවුල් නද වෙණ නදින් එක් කොට ඉතා**
උන් එදා දුන් රඟ දුටොත් තව සක් සැපත් කවරෙක් පතා

(අ) දෙව්ලියන් ළය මැද සරසා ගෙන සිටි මුතු ලතාව සම කොට ඇත්තේ කුමකට ද?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අර්ථය ලියන්න.

අන්තර්ගතය -එච්.එම්.ජේ.එස්.කුමාරසිංහ, ආනන්ද විද්‍යාලය, කොළඹ 10
සැකසුම -කේ.ජී.එම්.අයි.තුෂාර, බ/අලුයටවෙල මහ විද්‍යාලය, මහියංගණය
Copyright©www.e-thaksalawa.moe.gov.lk

## ක්‍රියාකාරකම iv

පහත සඳහන් අර්ථ ප්‍රකාශ කෙරෙන පද පාඨමේ ඇතුළත් කවිවලින් උපුටා දක්වන්න.

i. පා පියුම --------------------------------------
ii. ලක්ෂ ගණන් දෙව්දුනු --------------------------------------
iii. ශක්‍රයා --------------------------------------
iv. දිව්‍ය ගාන්ධර්වයන් --------------------------------------
v. ඝෝෂාව නවත්වා -------------------------------------
vi. ජයග්‍රහණයේ ඝෝෂාව ---------------------------------------
vii. පියාපත් සැලුම් නැති ---------------------------------------
viii. සවන් වැටුණු කල්හි --------------------------------------
ix. පංචසිඛ --------------------------------------
x. නයි සමූහය රැස් වූහ ---------------------------------------
xi. සත්ත්වසාරයා ---------------------------------------
xii. සන්තෝෂය වඩවන -----------------------------------------
xiii. අනංගයාගේ ---------------------------------------
xiv. රත්‍රං හා රස දිය ---------------------------------------
xv. අනංගයාගේ ඊ තල ---------------------------------------

## ක්‍රියාකාරකම v

1. ගුත්තිල ආචාර්යයන්ගේ වීණා වාදනයෙන්

i. තිරිසන් ගත සතුන්
ii. දෙව්-මිනිසුන් යන පිරිස්

සන්තෝෂයට පත් වූ ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

2.

i. වංචාවෙන් අතවැසියා පරාජය කළ ගුරුතුමාත්
ii. කළ ගුණ නො දත් දුදන අතවැසියාත්

දෙදෙනාගේ ම චරිත ක්‍රියාවලිය උත්ප්‍රාසයෙන් නිරූපණය කිරීම ගුත්තිල කවියාගේ අභිප්‍රාය යි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් සාකච්ඡා කරන්න.

අන්තර්ගතය -එච්.එම්.ජේ.එස්.කුමාරසිංහ, ආනන්ද විද්‍යාලය, කොළඹ 10

සැකසුම -කේ.ජී.එම්.අයි.තුෂාර, බ/අලුයටවෙල මහ විද්‍යාලය, මහියංගණය

Copyright©www.e-thaksalawa.moe.gov.lk

3.

i. සුමියුරු සංගීතයක් ද?
ii. අපූරු නර්තනයක් ද?

උත්කර්ෂයෙන් වර්ණනා කිරීමට ගුත්තිල කවියා පළ කරන ප්‍රතිභාව කෙබඳු දැයි එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පෙන්වා දෙන්න.

4.

i. අර්ථාලංකාර
ii. ශබ්දාලංකාර

උචිත තැන යෙදීමට ගුත්තිල කවියා සතු ව ඇති කුශලතාව එක් කරුණකට උදාහරණ දෙක බැගින් සපයමින් පැහැදිලි කරන්න.

5. ගුත්තිල කවියා

i. අඛණ්ඩ සිද්ධි කථනයේ දී සරල කාව්‍ය භාෂාවත්
ii. විචිත්‍ර වර්ණනාවල දී විදග්ධ කාව්‍ය භාෂාවත් මනාව යොදා ගන්නා අන්දම එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් සාකච්ඡා කරන්න.

6. අර්ථයෙන් ප්‍රකාශ කරන දෙයට උචිත ආකාරයෙන් තැනට ගැළපෙන විරිත් යොදා ගැනීම සම්බන්ධයෙන් ගුත්තිල කවියා පළ කරන ප්‍රතිභාව කෙබඳු දැයි පෙන්වා දෙන්න.

අන්තර්ගතය -එච්.එම්.ජේ.එස්.කුමාරසිංහ, ආනන්ද විද්‍යාලය, කොළඹ 10

සැකසුම -කේ.ජී.එම්.අයි.තුෂාර, බ/අලුයටවෙල මහ විද්‍යාලය, මහියංගණය
Copyright©www.e-thaksalawa.moe.gov.lk